www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බොදු බල සේනා හා මියන්මාර බෞද්ධ අන්තවාදී සංවිධානය පෙළ ගැසෙති

**පානිනී විජේසිරිවර්දන විසිනි**
**2014 ඔක්තෝබර් 6**

බෞද්ධ අන්තවාදී සංවිධාන දෙකක් වන ශ්‍රී ලංකාවේ බොදු බල සේනා (බොබසේ) සහ මියන්මාරයේ 969 ව්‍යාපාරය අතර පසුගිය 30 වන දා අත්සන් කෙරුනු ගිවිසුමෙන් මුස්ලිම් හා අන්‍ය ආගම් විරෝධී බෞද්ධ අන්තවාදී උද්ඝෝෂනයේ අලුත් පෙලගැස්මක් සනිටුහන් කෙරෙයි.

ගිවිසුම තම "දැක්ම" මෙසේ ඉදිරිපත් කරයි: "සමස්ත දකුනු සහ ගිනිකොන ආසියාව සියලුම ආකාරයේ මූලධර්මවාදී ව්‍යාපාර, අන්තවාදයන් සහ සිවිල් සහ ජාත්‍යන්තර යුද්ධවලින් තොර සාමකාමී කලාපයක් බවට පත් කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු. එම දැක්ම සාක්ෂාත් කරනු වස් බෞද්ධාගමිකයන්, බෞද්ධ රටවල්, බෞද්ධ උරුමයන් සහ බෞද්ධ ශිෂ්ඨාචාරය රැක ගැනීමට ද්විපාර්ශ්වයම සහයෝගයෙන් සහ සහභාගිත්වයෙන් ක්‍රියා කිරීමට අරමුනු කර ගනී." සාමකාමී කලාපයක් සඳහා ව්‍යාජ ලෙස ශපථ වෙතත් ගිවිසුමේ සැබෑ අරමුන කුමක්ද යන්න මෙම සංවිධානයන්හි මුස්ලිම් විරෝධී ප්‍රචන්ඩත්වයේ කුප්‍රකට ඉතිහාසයෙන්ම පැහැදිලිය.

පසුගිය තෙවසර තුල විවිධාකාර මුස්ලිම් විරෝධී ප්‍රකෝපකරනයන්හි හා උද්ඝෝෂනයන්හි යෙදුනු බොබසේ, එහි කුලු ගැන්වීම ලෙස පසුගිය ජූනි මාසයේ අලුත්ගම මුස්ලිම් ජනතාවට එරෙහි ම්ලේච්ඡ ප්‍රහාරයක් දියත් කලේය. සැලසුම්ගත ප්‍රකෝපකරනයකින් පසුව අලුත්ගම නගරයට කඩා වැදුනු සිංහල බෞද්ධ අන්තවාදීහු මුස්ලිම් ජනයාට හිමි කඩ සාප්පු දුසිම් ගනනක් ගිනිබත් කලහ. අනතුරුව තදාසන්න මුස්ලිම් නිවස්නා ප්‍රදේශවලට වැදුනු මෙම මැරයෝ නිවාස ගිනි තබමින් හා වස්තුව කොල්ලකමින් එහි පදිංචි මහජනයාට ම්ලේච්ඡ ලෙස පහර දුන්හ. ප්‍රහාරයෙන් අවම වශයෙන් තිදෙනෙකු මරා දැමුනු අතර 60 කට තුවාල සිදු කෙරින. මේ සිදුවීම් බොහෝමයක් ඇතිවූයේ ආන්ඩුව විසින් ප්‍රදේශයට යවන ලද මිලිටරි හා පොලිස් බලකායන්ගේ අනුග්‍රහය ද ඇතිව ය.

969 සංවිධානයේ මුස්ලිම් විරෝධී වාර්තාව ඊටත් වඩා ලේවැකි එකකි. එහි නායකත්වය දරන අශින් විරාතු නම් වූ බෞද්ධ භික්ෂුව හඳුන්වනු ලබන්නේමත් "බුරුම මුස්ලිම්වරුන්ගේ ගහලයා" යනුවෙනි. මුස්ලිම් විරෝධී ප්‍රචන්ඩත්වයන් සම්බන්ධයෙන් 2003 දී සිරගත කෙරුනු විරාතු නිදහස් කෙරුනේ 2012 දීය. විරාතු විසින් තමා හඳුන්වාගනු ලබන්නේ "බුරුම බින් ලාඩන්" යනුවෙනි. 2012-2013 වසර වල 969 සංවිධානය මගින් මියන්මාර්හි රාකිනේ ප්‍රාන්තයේ රොහින්ග්‍යා මුස්ලිම්වරුන්ට (බංග්ලාදේශ සම්භවයක් ඇති මුස්ලිම් ජනයා) එරෙහිව මුදාහල ප්‍රචන්ඩත්වයන් මගින් සිය ගනනක් මුස්ලිම් ජනයා මරා දැමුනු අතර දසදහස් ගනනකට උන්හිටිතැන් අහිමි කෙරින.

ගිවිසුමට අත්සන් තැබුවේ විරාතු සහ බොබසේ හි ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර විසිනි. ඊට දින දෙකකට පෙර, 28 දා කොලඹ පැවති බොබසේ "ජාතික සමුලුව" ට ද විරාතු සහභාගි විය. සමුලුවට සහභාගි වන ලෙස ඥානසාර විසින් විරාතුට කරන ලද ඇරැයුම ප්‍රසිද්ධියට පත්වීමත් සමග විවිධ මුස්ලිම් සංවිධාන, මානව හිමිකම් සංවිධාන සහ මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විරාතුගේ පැමිනීමට බලගතු ලෙස විරුද්ධ වෙමින් ඔහුට වීසා නිකුත් නොකරන ලෙස රාජපක්ෂ ආන්ඩුවෙන් ඉල්ලා සිටියහ.

ශ්‍රී ලංකා මුස්ලිම් සභාව ජනාධිපති මහින්ද රාජපක්ෂට යවන ලද ලිපියකින් පෙන්නුම් කර ඇත්තේ බොබසේ සමුලුවට විරාතුගේ සහභාගිත්වය සහ ඔහු එහිදී කරන කතාව "මුස්ලිම් ජනයාට එරෙහිව ගෙනයන ප්‍රචන්ඩත්වය තවදුරටත් වැඩිවීමට තුඩු දිය හැකි" බවයි.

මුස්ලිම් කොන්ග්‍රස් පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එච්.එම්. හාරිස් ප්‍රකාශයක් නිකුත් කරමින් මෙසේ කියා සිටියේය: "රොහින්ග්‍යා මුස්ලිම් ජන ඝාතනය ආරම්භ කල විරාතු නම් භික්ෂුවගේ පැමිනීමෙන් මුස්ලිම් ප්‍රජාව අතර භීතියක් ජනනය කෙරී ඇත. විශේෂයෙන්ම මෙරටේ මුස්ලිම්වරුන් සහ බෞද්ධයන් අතර එකමුතුව සඳහා උත්සාහ දරන මේ මොහොතේ බලධාරීන් විසින් එයට ඉඩ නොදිය යුතුය."

කෙසේ නමුදු, බොබසේ සමුලුව අමතමින් විරාතු පැවසුවේ "අන්තවාදීන්ගේ බාධක නොතකා" තමාට වීසා ලබා දීම සම්බන්ධයෙන් ජනාධිපති රාජපක්ෂට ස්තුති කරන බවයි. ස්තුතිය පිටුපසින් පවතින්නේ මෙම අන්තවාදී සංවිධාන සහ රාජපක්ෂ තන්ත්‍රය අතර ඇති සමීප සම්බන්ධතාවයි.

ගිවිසුමේ සඳහන් "යුද්ධවලින් තොර සාමකාමී කලාපයක්" ගොඩනැගීමට විපරීතව ඔහු මෙසේ කියා සිටියේය: "බෞද්ධයන් ලෝකයේ සුලුතරයකි. මතක තබා ගන්න, මෙම කුඩා කන්ඩායම රැක නොගත්තහොත් එය බෞද්ධයන්ගේ අවසානය වනු ඇත.... මෙය සාක්ෂාත් කරනු වස් මගේ 969 සංවිධානය බොදු බල සේනා සංවිධානය සමග අතිනත ගෙන වැඩ කරනු ඇත."

සමුලුවේ ආරම්භක කතාව කරමින් බොබසේ සභාපති කිරම විමලජෝති පවසා ඇත්තේ "ශ්‍රී ලංකාව සිංහල බෞද්ධ රටක් මිස බහු ආගමික රටක් නොවන" බවයි. වාර්තාවන්ට අනුව, මෙම සමුලුවේ දී සිංහල බෞද්ධ රාජ්‍යයක් ස්ථාපිත කිරීම සඳහා වන ප්‍රතිපත්ති රාමුවක් ද සම්මත කෙරී ඇත.

මේ අතර පසුගිය 24 දා බොබසේ සහ ඉන්දියාවේ පාලක භාරතීය ජනතා පක්ෂය (බීජේපී) අතර කොලඹදී නිල සාකච්ඡාවක් පැවැති බව හා එයට බීජේපී හි ජාතික ප්‍රධාන ලේකම් මුරලිධර් රාඕ සහභාගිවූ බවද බොබසේ ප්‍රධාන විධායක ඩිලන්ත විතානගේ නේෂන් පුවත්පතට ප්‍රකාශ කර ඇත. එහිදී විතානගේ තවදුරටත් කියා සිටියේ "දෙපාර්ශ්වයට එක්ව ක්‍රියාකිරීමේ හැකියාවන් පිලිබඳව" සාකච්ඡා කල බවයි. මුස්ලිම් විරෝධී ප්‍රචන්ඩත්වයන් පිලිබඳ කුප්‍රකට හින්දු ස්වෝත්තමවාදී බීජේපී ය, රාජපක්ෂගේ පාලක සභාගය මෙන්ම බොබසේ වැනි මුස්ලිම් විරෝධී අන්තවාදී සංවිධාන තම කම්කරු විරෝධී ප්‍රචන්ඩත්වයේ අත් ගෙඩි ලෙස යොදාගත හැක්කේ කෙසේද යන්න පිලිබඳව ගනන් බලන බව නිසැකය.

මෙම තතු තුල ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව බොබසේ ඇතුලු අන්තවාදීන්ගේ ප්‍රචන්ඩත්වය ආවරනය කරමින් ඔවුනට සුදුහුනු තවරමින් සිටී. අලුත්ගම ප්‍රචන්ඩ ක්‍රියා වලට එරෙහිව රට පුරා මතුවූ පුලුල් විරෝධතා මැඩීමට පොලීසිය යෙදවූ රාජපක්ෂ සිද්ධියට වග කිව යුත්තේ මුස්ලිම් අන්තවාදීන් යයි පවසමින් ප්‍රචන්ඩත්වයට ගොදුරු වූ මුස්ලිම් ජනයාටම චෝදනා කලේය.

1948 "නිදහසෙන්" පසු ලංකාවේ මෙතෙක් පැවති ධනපති ආන්ඩු - එක්සත් ජාතික පක්ෂය හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආන්ඩු තම පාලනය ගෙන ගියේ කම්කරු පන්තිය ධනපති පන්තියෙන් ස්වාධීන වීම වලක්වා ගනු වස් වර්ගවාදය උසි ගන්වමින් කම්කරු පන්තිය භේද කිරීමෙනි.

යලි යලිත් තහවුරු වෙමින් පවතින්නේ, කම්කරු පන්තිය භේද කිරීම සඳහා යහමින් යොදා ගතහැකි බොබසේ වැනි ෆැසිස්ට් පන්නයේ සංවිධානවල ප්‍රචන්ඩ ක්‍රියාවන් සඳහා රාජපක්ෂ ආන්ඩුවේ මෙන්ම පොලීසිය, හමුදාව ඇතුලු රාජ්‍ය ආරක්ෂක අංශයන්හි පිටුබලය සහ රැකවරනය නොමඳව ලැබෙන බවයි.

උතුරු නැගෙනහිර දෙමල ජනයාට එරෙහිව වර්ගවාදී යුද්ධය අවසන් කිරීමෙන් පසු, ආන්ඩුව යලිත් වර්ගවාදී හා ආගම්වාදී රේඛා ඔස්සේ කම්කරු පන්තිය භේද කිරීම සඳහා ක්‍රියා කරමින් සිටින්නේ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයේ අවශ්‍යතාව මත සමාජ සුබසාධන දැවැන්ත ලෙස කප්පාදු කරමින් සමාජ ප්‍රතිවිප්ලවයේ වැඩපිලිවෙල කම්කරු පීඩිත මහජනතාව මත පටවමින් සිටින තතු තුල ය.

බොදු බල සේනා, රාවනා බලකාය, සිහල රාවය වැනි සංවිධාන පෙරට දැමුනේ රාජපක්ෂ ආන්ඩුව උසිගන්වන වර්ගවාදය තුලිනි. ඊට සිංහල ධනපති පන්තියේ සැහෙන කන්ඩායමක ද ජන මාධ්‍යවලින් ද පිටුබලය සැපයෙයි.

කෙසේ නමුදු, ජනාධිපති රාජපක්ෂ තම සංවිධානයට දක්වන පක්ෂපාතිත්වය තිබියදීම, බොබසේ සමුලුවේ ප්‍රධාන කතාව කල ගලගොඩඅත්තේ ඥානසාර, තම වැඩපිලිවෙලට පූර්න අනුග්‍රහය දක්වන නව ආන්ඩුවක හා නව රාජ්‍ය නායකයකුගේ අවශ්‍යතාව අවධාරනය කොට ඇත. "ලංකාවේ ආන්ඩුව සහ විපක්ෂයන් වෙනස් වීමට බලාපොරොත්තු නොවේ නම් අපි ඒ සියලු දෙනාම වෙනස් කරන්නෙමු. මහින්ද රාජපක්ෂට, රනිල් වික්‍රමසිංහට සහ අනුරකුමාර දිසානායකට වෙනස් වීමට නොහැකි නම් ඉවත්ව යාමට සූදානම් වන ලෙස අපි අනතුරු අඟවන්නෙමු." යැයි ඥානසාර පවසා තිබේ. මෙම "වෙනස්වීම" අන් කිසිවක් නොව සිංහල බෞද්ධ රාජ්‍යයක් ගොඩනැගීම දෙසට සිදු කෙරෙන වෙනස්වීමයි. එයට අවශ්‍ය මුස්ලිම් සහ ක්‍රිස්තියානි විරෝධී ෆැසිස්ට් පන්නයේ ප්‍රචන්ඩත්වය සඳහා කෙරෙන වෙනස් වීමයි.

"ඉස්ලාම් ව්‍යාප්තිය"කට සහ "ඉස්ලාම් ආක්‍රමනය"කට ශ්‍රී ලංකාව යටත් කෙරෙමින් පවතින බව පැවසූ ඥානසාර එයට එරෙහිව සටන් කිරීමේ "පිටකොන්දක්" දේශපාලනඥයන්ට නොමැති බව ද සඳහන් කලේය. එයට එරෙහිව සටන් කල හැකි එකම බලවේගය බෞද්ධ භික්ෂූන් බව ද ඔහු පැවසීය.

බොබසේ හි මෙම නව මුස්ලිම් විරෝධී පෙල ගැසීම් මූලික වශයෙන්ම එල්ල කෙරී පවතින්නේ කම්කරු පන්තියට එරෙහිවයි. මෙම අන්තවාදීන්ගේ පෙල ගැස්ම හා ප්‍රචන්ඩ සූදානම බරපතල අනතුරු ඇඟවීමක් ලෙස කම්කරු පන්තිය ගත යුතුය.

මෙබඳු වර්ගෝත්තමවාදී ෆැසිස්ට් මාදිලියේ සංවිධාන පැන නැගීම හා පැන නංවා ගැනීම ජාත්‍යන්තර ප්‍රපංචයක් වී තිබේ. ලෝක ධනවාදයේ බිඳවැටීම තුල ඒ ඒ රටවල කම්කරු පන්තිය හා එහි අයිතීන් තලා දැමීම සඳහා පාලක පන්තීන්ට එබඳු සංවිධාන අවශ්‍ය වී ඇත. ග්‍රීසියේ ගෝල්ඩන් ඩෝන් හා යුක්‍රේනයේ ස්වබෝදා හා දක්ෂින නිකාය එලෙස ක්‍රියා කරන ෆැසිස්ට් සංවිධානයන් ය.

ප්‍රකෝපකාරී චිරතු භික්ෂුවට වීසා නොදෙන ලෙස ඉල්ලීම හා අලුත්ගම ප්‍රහාරය උසිගැන්වූ බොබසේ නායකයන්ට එරෙහිව ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යොදාගැනීම ආදී ඉල්ලීම් මගින් මෙම ප්‍රතිවිප්ලවවාදී සංවිධාන මැඩ ලිය නොහැක. එම ඉල්ලීම් ඉදිරිපත්ව ඇත්තේ මෙම සංවිධාන රහසේ හා එලිපිට හදාවඩා ගන්නා රාජපක්ෂ පාලක කල්ලියෙනි. එවැනි ඉල්ලීම් එහි අත් ශක්තිමත් කරමින් කම්කරු පන්තියට එරෙහි පාරාවලල්ලක් කර ගනු ඇත.

කම්කරු පන්තිය මෙම ඉල්ලීම්වලට සහාය නොදිය යුතු ය. එය කල යුතුව ඇත්තේ තමන්ගේ ම විප්ලවවාදී විධික්‍රමයන්ගෙන් මෙම අන්තවාදී කන්ඩායම්වලට ද ඒවා හදාවඩාගන්නා ධනපති පන්තියට හා එහි පාලක ආන්ඩුවට ද විරුද්ධව සටන් කිරීම යි. එනම්, මෙම ප්‍රතිගාමීත්වයේ මූලාශ්‍රය වන ධනේශ්වර ක්‍රමය පෙරලා දැමීම සඳහා ද තමන්ගේ ම කම්කරු-ගොවි ආන්ඩුවක් බලයට ගෙන ඒමට සමාජවාදී වැඩපිලිවෙල සඳහා ද ජාත්‍යන්තර කම්කරු පන්තිය සමග එකමුතු වී සටන් කිරීම ය.

© www.wsws.org